# ආර්ථික විද්‍යාව

# Economics - MCQ

## ආර්ථික වර්ධනය හා සංවර්ධනය

### පසුගිය වසර 06 ක බහුවරණ ප්‍රශ්න 2015 - 2022

**කුෂාන්**
වීරහැන්නැදිගේ
Masters in Economics,
BA Economics (special),
Executive Diploma in Human Resource Management,
Executive Diploma in Strategic Business Management,
Diploma in Marketing Management,
Advance certificate training and Human Resource development.

WhatsApp - 0768524299

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2015 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2015 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2015

ආර්ථික විද්‍යාව I
பொருளியல் I
Economics I

21 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**46.** ආර්ථික වෘද්ධිය සාමාන්‍යයෙන් මිනුම් කරනුයේ,

(1) නාමික දළ දේශීය නිෂ්පාදිතයේ වාර්ෂික ප්‍රතිශතාත්මක වෙනස මගිනි.

(2) මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වාර්ෂික ප්‍රතිශතාත්මක වෙනස මගිනි.

(3) නාමික ප්‍රති ශීර්ෂ දළ දේශීය නිෂ්පාදිතයේ වාර්ෂික ප්‍රතිශතාත්මක වෙනස මගිනි.

(4) ප්‍රතිශීර්ෂ වැය කළ හැකි ජාතික ආදායමේ වාර්ෂික ප්‍රතිශතාත්මක වෙනස මගිනි

(5) ක්‍රය ශක්ති සාම්‍ය ප්‍රති ශීර්ෂ දළ දේශීය නිෂ්පාදිතයේ වාර්ෂික ප්‍රතිශතාත්මක වෙනස මගිනි. (......)

**47.** කිසියම් කල්පිත ආර්ථිකයක සේවා වියුක්ත ජනගහනය ලෙස වර්ග කෙරුණු පිරිස 50 000ක් ද, සේවා නියුක්ත ජනගහනය ලෙස වර්ග කෙරුණු පිරිස 450 000ක් ද වේ නම්, එම ආර්ථිකයේ සේවා වියුක්ත අනුපාතිකය,

(1) 11.1% ක් වේ. (2) 10.0% ක් වේ. (3) 9.2% ක් වේ.

(4) 8.0% ක් වේ. (5) 7.4% ක් වේ. (......)

**48.** පසුගිය වසර 10 තුළ කිසියම් රටක ආදායම් ව්‍යාප්තියේ ජිනි සංගුණකය 0.45 සිට 0.65 දක්වා ඉහළ ගොස් ඇතැයි වාර්තා වී තිබේ. මෙම වෙනස්වීම ඇති කරලීමෙහි ලා හේතු විය හැක්කේ පහත සඳහන් කවර කරුණක් ද?

(1) සාධක වෙළෙඳපොළෙහි සහ භාණ්ඩ වෙළෙඳපොළෙහි වෙළෙඳපොළ බලය වැඩි වීම

(2) ශ්‍රම වෙළෙඳපොළෙහි විෂමතා ඉවත්කරලීම

(3) වඩා සාධාරණ ලෙසින් ධනය සහ දේපළ බෙදී යාම කුෂාන් වීරහැන්නැදිගේ

(4) වැඩිහිටි ජනගහනයෙන් බහුතරයක් අවම වශයෙන් උසස් පෙළ සාමාර්ථයවත් ලබා තිබීම

(5) වඩාත් අනුක්‍රම බද්ධ ක්‍රමයක් අනුගමනය කිරීම (......)

කුෂාන් වීරහැන්නැදිගේ

**49.** කිසියම් රටක ආදායම් ව්‍යාප්තියෙහි අසමානතා අඩු කිරීමෙහි ලා වඩාත් දායකවිය හැක්කේ පහත සඳහන් කවර කරුණක් ද?

(1) ජනගහන වර්ධන අනුපාතිකයෙහි ඉහළ යාම

(2) අඩු නිපුණතා සහිතව සේවා නියුක්ත ශ්‍රමිකයනට වෘත්තීය පුහුණුව ලබාදීම

(3) අයවැය හිඟය ඉහළ යාම

(4) සේවා වියුක්ත ශ්‍රමිකයන් පුහුණු කිරීම සඳහා වෙන් කෙරෙන අරමුදල් ප්‍රමාණය අඩුවීම

(5) ප්‍රතික්‍රම බද්දක් පැනවීම (......)

**50.** පසුගිය දශක කීපය මුළුල්ලේ ගෝලීය වශයෙන් හටගෙන ඇති ආනයන හා අපනයන වෙළෙඳාමේ දැවැන්ත ප්‍රසාරණයට මූලික වශයෙන් හේතු වී ඇත්තේ,

(1) බොහෝ රටවල තීරු බදු නොවන බාධක ඉවත් කරලීම ය.

(2) බොහෝ රටවල් ආරක්ෂණවාදී ප්‍රතිපත්ති කරා වැඩි වශයෙන් යොමු වීම ය.

(3) ලෝකයේ ප්‍රවාහන හා සන්නිවේදන පිරිවැය වේගයෙන් පහළ වැටෙමින් පැවතීම ය.

(4) සංවර්ධනය වන රටවල වැටුප් මට්ටම් පහළ වැටීම ය.

(5) බොහෝ රටවල දේශපාලන අධිකාරිය මධ්‍යගත සැලසුම්කරණයෙන් ඉවත් වීම ය. (......)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2016 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2016 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2016

| | |
|---|---|
| ආර්ථික විද්‍යාව | I |
| பொருளியல் | I |
| Economics | I |

**21 S I**

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
*Two hours*

කුෂාන් වීරහැන්නැදිගේ

**44.** සමහර කර්මාන්තශාලා ස්වයංක්‍රීයකරණය (automation) වීම නිසා ඇතැම් සාම්ප්‍රදායික සේවකයන් කුසලතා නොගැළපීමකට මුහුණපාන අතර, ඔවුන්ගෙන් සමහරු සේවා වියුක්තිකයන් බවට පත් වෙති. අනික් අතට පරිගණක ක්‍රියාකරුවන්ට ඉහළ ඉල්ලුමක් පවතී. මෙම විරැකියා ස්වරූපය වර්ගකරනුයේ,

(1) චක්‍රීය සේවා වියුක්තිය වශයෙනි.

(2) සාර්මික සේවා වියුක්තිය වශයෙනි.

(3) ස්වාභාවික සේවා වියුක්තිය වශයෙනි.

(4) ව්‍යුහමය සේවා වියුක්තිය වශයෙනි.

(5) සැඟවුණු සේවා වියුක්තිය වශයෙනි. (......)

45. කිසියම් රටක් සංවර්ධනය අත්කර ගෙන ඇතැයි යන්න වඩාත් හොඳින් පෙන්නුම් කරනුයේ කවර වෙනසක් මගින් ද?

(1) එම රටේ මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වැඩි වීමක්

(2) එම රටට හිමි ලෝක අපනයන ප්‍රතිශතයේ වැඩි වීමක්

(3) එම රටේ ගෙවුම් ශේෂය යහපත් වීමක්

(4) එම රටේ මුදල් ඒකකයේ අගය ඉහළ යාමක්

(5) එම රටේ සාමාන්‍ය පුරවැසියාගේ ජීවන තත්ත්වයේ අභිවෘද්ධියක් (......)

46. මුළු යැපුම් අනුපාතය යනු,

(1) වැඩිහිටි ජනගහනයට ළමා ජනගහනයේ අනුපාතයයි.

(2) ශ්‍රම හමුදාවේ සේවා නියුක්ත ජනගහනයට සේවා වියුක්ත ජනගහනයේ අනුපාතයයි.

(3) වැඩ කරන වයසේ ජනගහනයෙන් පුද්ගලයන් 100කට වයස අවුරුදු 65ට වැඩි ජනගහනයේ අනුපාතයයි.

(4) වයස අවුරුදු 15ට වැඩි ජනගහනයට වයස අවුරුදු 15ට අඩු ජනගහනයේ අනුපාතයයි.

(5) වයස අවුරුදු 15 - 59 වයසේ ජනගහනයට වයස අවුරුදු 15ට අඩු සහ අවුරුදු 59ට වැඩි ජනගහනයේ අනුපාතයයි. (......)

47. 2012/13 සමීක්ෂණ දත්තවලට අනුව ශ්‍රී ලංකාවේ ජනගහන දරිද්‍රතා දර්ශකයේ ආංශික ව්‍යාප්තිය නිවැරදිව දැක්වෙනුයේ පහත සඳහන් කවර දත්ත පෙළකින් ද?

| | නාගරික අංශය% | ග්‍රාමීය අංශය% | වතු අංශය% |
|---|---|---|---|
| (1) | 4.5 | 10.2 | 16.3 |
| (2) | 2.5 | 6.7 | 12.9 |
| (3) | 4.2 | 7.5 | 10.6 |
| (4) | 2.1 | 7.6 | 10.9 |
| (5) | 3.1 | 7.9 | 10.2 |

(......)

48. පහත දැක්වෙන කෙබඳු ආර්ථික ගැටලුවක් ඇගැයීමෙහිලා ලෝරන්ස් වක්‍රය භාවිත කළ හැකි ද?

(1) ආර්ථිකයේ නිෂ්පාදන හා සම්පත් බෙදා වෙන්කිරීමේ කාර්යක්ෂමතාව
(2) වෙළෙඳ හවුල්කරුවන්ගේ සාපේක්ෂ වාසි
(3) රටවල් අතර විශේෂීකරණයේ තීව්‍රතාව
(4) ආදායම් බෙදීයාමේ සාධාරණත්වය
(5) සේවා වියුක්තිය හා මිල ස්ථායිතාව අතර සම්බන්ධතාව (......)

49. 2014 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයට සහ සේවා නියුක්තියට, කෘෂිකර්මාන්ත අංශයේ දායකත්වය නිවැරදි ව දැක්වෙන්නේ පහත සඳහන් කවරක් මගින් ද?

| | දළ දේශීය නිෂ්පාදිතය% | සේවා නියුක්තිය% |
|---|---|---|
| (1) | 16.0 | 28.5 |
| (2) | 22.8 | 32.3 |
| (3) | 12.8 | 45.0 |
| (4) | 10.5 | 26.5 |
| (5) | 10.1 | 28.5 |

(……)

50. පහත සඳහන් රටවල් අතුරෙන් G7 කණ්ඩායමෙහි සාමාජිකයකු **නොවන** රට කුමක් ද?

(1) ජපානය (2) කැනඩාව (3) ප්‍රංශය (4) ඉතාලිය (5) රුසියාව (……)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2017 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தரப் பரீட்சை, 2017 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2017

ආර්ථික විද්‍යාව I
பொருளியல் I
Economics I

21 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
*Two hours*


කුෂාන් වීරහැන්නැදිගේ

45. එක්තරා ආර්ථිකයක ක්‍රය ශක්ති සාම්‍යය පදනම් කර ගත් ප්‍රතිශීර්ෂ දළ ජාතික ආදායම (GNI) කිසියම් කාලපරිච්ඡේදයකදී ඉහළ ගොස් තිබුණ ද, මානව සංවර්ධන දර්ශකය මගින් මනිනු ලබන සංවර්ධනය නොවෙනස්ව තිබිණි. මෙම වෙනස පැහැදිලි කළ හැක්කේ කෙසේ ද?

(1) ළමයින් පාසල් යතියි අපේක්ෂිත වර්ෂ ගණන ඉහළ යාම නිසා
(2) උපතේ දී ආයු අපේක්ෂාව පහළ වැටීම නිසා
(3) වැඩිහිටි සාක්ෂරතා අනුපාතිකය පහළ වැටීම නිසා
(4) උද්ධමන අනුපාතිකය ඉහළ යාම නිසා
(5) ජනගහන වර්ධන අනුපාතිකය ඉහළ යාම නිසා (......)

කුෂාන් වීරහැන්නැදිගේ

**46.** එක්තරා ආර්ථිකයක කුටුම්බ ආදායම් ව්‍යාප්තියට අදාළ ලෝරන්ස් වක්‍රය පහත රූපසටහනෙහි දැක්වේ.




මෙම ආර්ථිකයේ ආදායම් ව්‍යාප්තියේ අසමානත්වය ජිනි සංගුණකය මගින් මනිනු ලබනුයේ,

(1) (A හි වර්ගඵලය + B හි වර්ගඵලය) ÷ C හි වර්ගඵලය මගිනි.

(2) B හි වර්ගඵලය ÷ C හි වර්ගඵලය මගිනි.

(3) A හි වර්ගඵලය ÷ (B හි වර්ගඵලය + C හි වර්ගඵලය) මගිනි.

(4) B හි වර්ගඵලය ÷ (B හි වර්ගඵලය + C හි වර්ගඵලය) මගිනි.

කුෂාන් වීරහැන්නැදිගේ

(5) C හි වර්ගඵලය ÷ (A හි වර්ගඵලය + B හි වර්ගඵලය) මගිනි. (......)

47. දෙන ලද වර්ෂයක කිසියම් කල්පිත ආර්ථිකයක ශ්‍රම වෙළෙඳපොළට අදාළ දත්ත සමහරක් පහත වගුවේ දැක්වේ.

| වැඩ කරන වයසේ ජනගහනය (මිලියන) | සේවා වියුක්ත ජනගහනය (මිලියන) | සේවා නියුක්ති අනුපාතිකය (%) |
|---|---|---|
| 25 | 3 | 80 |

මෙම ආර්ථිකයේ ශ්‍රම හමුදා සහභාගිත්ව අනුපාතිකය

(1) 20% කි. (2) 30% කි. (3) 40% කි. (4) 50% කි. (5) 60% කි. (......)

48. 2012/13 වර්ෂයේ ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණයට අනුව ශ්‍රී ලංකාවේ ඉහළ ම ජනගහන දරිද්‍රතා දර්ශකය සහිත දිස්ත්‍රික්ක තුන වනුයේ

(1) මුලතිව්, මොණරාගල සහ මන්නාරම ය.
(2) මඩකලපුව, මන්නාරම සහ කිලිනොච්චිය ය.
(3) මන්නාරම, මුලතිව් සහ බදුල්ල ය.
(4) මන්නාරම, මුලතිව් සහ කිලිනොච්චිය ය.
(5) මුලතිව්, මඩකලපුව සහ මොණරාගල ය. (......)

49. ශ්‍රී ලංකාවේ නිරපේක්ෂ දරිද්‍රතා මට්ටමේ පහළ බැසීමක් හටගෙන තිබුණ ද සැලකිය යුතු ප්‍රමාණයේ ආදායම් විෂමතා අඛණ්ඩව පවතී. මෙය තහවුරු වන්නේ ධනවත් ම කුටුම්බ 10% මුළු කුටුම්බ ආදායමෙන් හිමි කර ගනු ලබන ප්‍රතිශතය

(1) 10.9%ක් වීමෙනි.
(2) 14.9%ක් වීමෙනි.
(3) 28.6%ක් වීමෙනි.
(4) 38.0%ක් වීමෙනි.
(5) 57.5%ක් වීමෙනි. (......)

කුෂාන් වීරහැන්නැදිගේ

50. පහත දැක්වෙන දෑ අතුරෙන් ශ්‍රී ලංකාවට විදේශීය ඍජු ආයෝජන ආකර්ෂණය කර ගැනීමෙහිලා ප්‍රබල බාධකයක් **නොවන්නේ** කවර කරුණක් ද?

(1) සාර්ව ආර්ථික අස්ථායී තත්ත්වයන්
(2) ශ්‍රම වෙළෙඳපොළේ දෘඪතාවන්
(3) ප්‍රතිපත්ති අවිනිශ්චිතතාව
(4) දූෂණය සහ නියාමනය දුර්වල වීම
(5) අපනයන ක්ෂේත්‍රයේ විවිධාංගීකරණය ප්‍රමාණවත් නොවීම (……)

කුෂාන් වීරහැන්නැදිගේ

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2018 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2018 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2018

2018.08.06 / 1300 - 1500

ආර්ථික විද්‍යාව I
பொருளியல் I
Economics I

**21 S I**

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
*Two hours*

කුෂාන් වීරහැන්නැදිගේ

**45.** ආදායම් විෂමතාව මිනිය හැක්කේ,

(1) දළ දේශීය නිෂ්පාදිතය සහ දළ ජාතික ආදායම අතර වෙනස මඟිනි.
(2) ජිනි සංගුණකය මඟිනි.
(3) මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන අනුපාතිකය මඟිනි.
(4) ජාතික දරිද්‍රතා ඉම මඟිනි.
(5) ප්‍රතිශීර්ෂ ආදායම මඟිනි.

(......)

**46.** පහත සඳහන් දර්ශක අතුරෙන් වර්තමානයේ මානව සංවර්ධන දර්ශකය සැකසීම සඳහා යොදා ගැනෙන දර්ශක තුන තෝරන්න.

A - ක්‍රය ශක්ති සාම්‍යයට ගළපන ලද ප්‍රතිශීර්ෂ දළ ජාතික ආදායම් දර්ශකය
B - උපත් අනුපාතික දර්ශකය
C - ආයු අපේක්ෂා දර්ශකය
D - වැඩිහිටි සාක්ෂරතා දර්ශකය
E - අධ්‍යාපන දර්ශකය

කුෂාන් වීරහැන්නැදිගේ

(1) A, B සහ C
(2) A, C සහ D
(3) A, C සහ E
(4) A, D සහ E
(5) C, D සහ E

(......)

කුෂාන් වීරහැන්නැදිගේ

**47.** රටවල් අතර ජීවන තත්ත්වයේ වෙනස්කම් පෙන්නුම් කිරීමෙහි ලා ප්‍රතිශීර්ෂ මූර්ත දළ ජාතික ආදායම් මිනුම, නොමග යවනසුළු දර්ශකයක් වේය යන්න ඇඟැවෙන්නේ පහත සඳහන් කවර තර්ක දෙකක් මගින් ද?

A - උද්ධමන අනුපාතිකයන්ගේ වෙනස්කම් සැලකිල්ලට නොගනී.

B - වෙළෙඳපොළ නොවන ආර්ථික ක්‍රියාකාරකම් පිළිබඳව, රටවල් අතර විවිධ මට්ටමින් වෙනස්කම් පවතී.

C - පාරිභෝගික අභිරුචීන්හි පවත්නා වෙනස්කම් සැලකිල්ලට නොගනී.

D - විනිමය අනුපාතිකය විකෘතිවීම් සැලකිල්ලට නොගනී. එබැවින් එම මිනුම ප්‍රකාශ කළ යුත්තේ 'ක්‍රය ශක්ති සාම්‍යයන්' පදනම් කර ගනිමිනි.

E - 'ආදායම් ප්‍රවේශය' ඔස්සේ ගණනය කරන දළ ජාතික ආදායම් මිනුම 'වියදම් ප්‍රවේශය' ඔස්සේ ගණනය කෙරෙන අගයට වඩා වෙනස් විය හැකි ය.

(1) A සහ B (2) B සහ C (3) B සහ D
(4) C සහ D (5) D සහ E (……)

**48.** තිරසාර සංවර්ධන අභිමතාර්ථ අතුරෙන් පළමුවන අභිමතාර්ථය දරිද්‍රතාවය පිළිබඳව ය. එම අභිමතාර්ථයෙන් අරමුණු කරනුයේ,

(1) 2030 වන විට දරිද්‍රතාවය අඩකින් කපා හැරීම ය.
(2) 2030 වන විට සෑම තැනම සෑම ස්වරූපයකම දරිද්‍රතාවය අවසන් කිරීම ය.
(3) 2030 වන විට දරිද්‍රතාවය 75% කින් අඩු කිරීම ය.
(4) කුසගින්න නිමා කොට සෑම පුද්ගලයකුටම ප්‍රමාණවත් ලෙස ආහාර ලබා ගැනීමට ඇති හැකියාව සහතික කරලීම ය.
(5) දරිද්‍රතාවය අඩුකර ගැනීමෙහි ලා ප්‍රගතියක් අත්කර ගැනීමට සෑම රටකටම ආධාර කිරීම ය. (……)

**49.** කිසියම් රටක ජනගහනය ප්‍රධාන වයස් කාණ්ඩ තුනක් අතර ව්‍යාප්ත වී ඇති ආකාරය පහත වගුවෙහි දැක්වේ.

| වයස් කාණ්ඩය | ජනගහනය (මිලියන) |
|---|---|
| අවුරුදු 0 - 14 | 6 |
| අවුරුදු 15 - 64 | 20 |
| අවුරුදු 65 සහ ඊට වැඩි | 4 |

මෙම රටෙහි මුළු යැපුම් අනුපාතිකය,

(1) 10% කි. (2) 20% කි. (3) 30% කි. (4) 33% කි. (5) 50% කි. (......)

**50.** වර්තමානයේ ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයෙහි ආංශික සංයුතිය නිවැරදිව දැක්වෙන්නේ පහත සඳහන් වගුවේ කවර දත්ත පෙළකින් ද?

| | කෘෂිකර්මාන්තය, වන වගාව සහ ධීවර කර්මාන්තය (%) | කර්මාන්ත (%) | සේවා (%) |
|---|---|---|---|
| (1) | 5 | 20 | 64 |
| (2) | 7 | 27 | 57 |
| (3) | 10 | 25 | 50 |
| (4) | 12 | 28 | 48 |
| (5) | 15 | 30 | 45 |

කුෂාන් වීරහැන්නැදිගේ

(......)

NEW
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

2019.08.05 / 1300 - 1500

ආර්ථික විද්‍යාව I
பொருளியல் I
Economics I

21 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
*Two hours*

කුෂාන් වීරහැන්නැදිගේ

**43.** තිරසාර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයට අනුව සියලුම ජාතීන් එකඟතාව පළ කළ තිරසාර සංවර්ධන ඉලක්ක සංඛ්‍යාව කොපමණ ද?

(1) 8 (2) 11 (3) 14 (4) 17 (5) 19

**44.** 2016 කුටුම්බ ආදායම් සහ වියදම් සමීක්ෂණයට අනුව, ශ්‍රී ලංකාවේ නාගරික හා ග්‍රාමීය අංශවල ජනගහන දරිද්‍රතා දර්ශක පිළිවෙළින්

(1) 4.1% හා 8.8% ය. (2) 2.0% හා 4.0% ය. (3) 1.9% හා 4.3% ය.
(4) 1.7% හා 3.3% ය. (5) 0.9% හා 3.4% ය.

**45.** මානව සංවර්ධන දර්ශකයේ එක් සංරචකයක් වනුයේ,

(1) ඌනසේවා නියුක්ත ජනගහන ප්‍රතිශතයයි.
(2) දෛනික ප්‍රෝටීන පරිභෝජනයේ සාමාන්‍ය අගයයි.
(3) උපතේ දී ආයු අපේක්ෂාවයි.
(4) ජනගහනයෙන් 1 000 කට වෛද්‍යවරුන්ගේ සංඛ්‍යාවයි.
(5) වැඩිහිටි සාක්ෂරතා අනුපාතිකයයි.

කුෂාන් වීරහැන්නැදිගේ

**46.** ආර්ථික සංවර්ධනය යනු
(1) ආර්ථික වෘද්ධියයි.
(2) ආර්ථික වෘද්ධිය සමග නිමැවුම බෙදී යාමේ සහ ආර්ථික ව්‍යුහයේ වෙනස්කම් සිදුවීමයි.
(3) නාගරික ජනගහනයේ ජීවන තත්ත්වය උසස්වීමයි.
(4) දළ ජාතික ආදායමේ තිරසාර වැඩි වීමයි.
(5) ජනගහනය තුළ ආදායම් විෂමතා ඉවත් කරලීමයි.

**47.** ලෝරන්ස් වක්‍රයක් යොදා ගත හැක්කේ පහත දැක්වෙන කවර ආර්ථික ගැටලුවක් ඇගැයීමට ද?
(1) වෙළෙඳපොළ සම්පත් බෙදා වෙන් කිරීමේ හා නිෂ්පාදනයේ කාර්යක්ෂමතාව
(2) වෙළෙඳ හවුල්කරුවන්ගේ සාපේක්ෂ වාසි සහ වෙළෙඳ අනුපාත
(3) රටවල් ඇතුළත විශේෂ ප්‍රාගුණ්‍ය මට්ටම සහ වෘද්ධිය
(4) වෙළෙඳපොළ මිලයන්හි සමතුලිතතාවය
(5) ආදායම් බෙදී යාමේ අසමානතා මට්ටම

**48.** කිසියම් කල්පිත ආර්ථිකයක සේවානියුක්තියට අදාළ දත්ත පහත වගුව පෙන්නුම් කරයි.

| වර්ෂය | ජනගහනය (මිලියන) | වැඩ කළ හැකි වයසේ ජනගහනය (මිලියන) | සේවා නියුක්ත සංඛ්‍යාව (මිලියන) | සේවා වියුක්ත සංඛ්‍යාව (මිලියන) |
|---|---|---|---|---|
| 1 | 50 | 25 | 12 | 3 |
| 2 | 60 | 32 | 14 | 2 |
| 3 | 70 | 40 | 20 | 5 |
| 4 | 80 | 45 | 24 | 6 |
| 5 | 90 | 50 | 26 | 4 |

විරැකියා අනුපාතිකය 20%ක් සහ ශ්‍රම හමුදා සහභාගිත්ව අනුපාතිකය 60%ක්ව පැවතියේ කවර වර්ෂයේ දී ද?

(1) 1 වර්ෂය (2) 2 වර්ෂය (3) 3 වර්ෂය (4) 4 වර්ෂය (5) 5 වර්ෂය

**49.** 1960 - 1977 කාලය තුළ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කළ ආර්ථික සංවර්ධන ප්‍රතිපත්තිය හැඳින්විය හැක්කේ කෙසේ ද?

(1) බාහිරාභිමුඛ අපනයන ප්‍රවර්ධන ප්‍රතිපත්තිය
(2) අභ්‍යන්තරාභිමුඛ ආනයන ආදේශන ආර්ථික ප්‍රතිපත්තිය
(3) නව ලිබරල් ආර්ථික ප්‍රතිපත්තිය
(4) විවෘත ආර්ථික ප්‍රතිපත්තිය
(5) වෙළෙඳපොළ කේන්ද්‍රීය සංවර්ධන ප්‍රතිපත්තිය

50. මෑත වර්ෂවල දී ශ්‍රී ලංකාවේ විදේශ විනිමය ඉපැයීම්වලට ඉහළම දායකත්වය ලබා දී ඇති ක්ෂේත්‍ර තුන වනුයේ,

(1) තේ, රෙදිපිළි හා ඇඟලුම් සහ සංචාරක ව්‍යාපාරයයි.

(2) සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ, රෙදිපිළි හා ඇඟලුම් සහ පෙට්‍රෝලියම් නිෂ්පාදිතයි.

(3) සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ, රෙදිපිළි හා ඇඟලුම් සහ රබර් නිෂ්පාදිතයි.

(4) තේ, රෙදිපිළි හා ඇඟලුම් සහ පෙට්‍රෝලියම් නිෂ්පාදිතයි.

(5) සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ, රෙදිපිළි හා ඇඟලුම් සහ සංචාරක ව්‍යාපාරයයි.

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka
Department of Examinations, Sri Lanka

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
# கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
# General Certificate of Education (Adv. Level) Examination, 2020

ආර්ථික විද්‍යාව I
பொருளியல் I
Economics I

21 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
*Two hours*

43. ආර්ථික සංවර්ධනය යන්නෙන් අදහස් වනුයේ
(1) ගෙවුම් ශේෂ අතිරික්තයක් සහිතව ආර්ථික වෘද්ධියක් හටගැනීම ය.
(2) ආර්ථික වෘද්ධියත් සමගම ව්‍යුහාත්මක සහ ගුණාත්මක වෙනස්කම් සිදුවීම ය.
(3) නාගරික ජනගහනයේ ජීවන තත්ත්වය උසස් වීම ය. කුෂාන් වීරහැන්නැදිගේ
(4) දළ ජාතික ආදායමේ (GNI) තිරසාර ඉහළ යාමක් ඇති වීම ය.
(5) සාධාරණ ආදායම් ව්‍යාප්තියක් සමගම දරිද්‍රතා මට්ටම පහළ වැටීම ය.

44. තිරසාර සංවර්ධනයක් යන්නෙන් හැඟැවෙනුයේ
(1) එහි ප්‍රතිඵල වශයෙන් අනාගතයේ පාරිසරික හායනයක් ඇතිවුවත්, වර්තමානයේ ආර්ථික හා සමාජයීය ශක්‍යතාව ලබාදෙන සංවර්ධනයකි.
(2) එහි ප්‍රතිඵලයක් වශයෙන් අනාගත පරම්පරාවන් සඳහා ආර්ථික හා සමාජයීය හායනයක් ඇතිවුවත්, වර්තමානයේ පාරිසරික තිරසාරභාවය ලබාදෙන සංවර්ධනයකි.
(3) අනාගත පරම්පරාවන්ට තම අවශ්‍යතා සපුරාගැනීමට ඇති හැකියාව කැප නොකොට, වර්තමාන අවශ්‍යතා සපුරාලනු ලබන සංවර්ධනයකි.
(4) මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ තිරසාර වැඩිවීමක් සහිතව ස්වභාවික සම්පත් සම්පූර්ණයෙන්ම උපයෝජනය කිරීමකි.
(5) එමගින් වර්තමාන සමාජයේ අවශ්‍යතා සපුරාගත නොහැකි වුවද අනාගත පරම්පරාවනට තම අවශ්‍යතා සපුරාගත හැකි වන සංවර්ධනයකි.

කුෂාන් වීරහැන්නැදිගේ

45. 'නිරපේක්ෂ' දරිද්‍රතා රේඛාව මගින් පෙන්නුම් කරනුයේ

(1) සමාජයේ දක්නට ලැබෙන අන්ත දරිද්‍රතා මට්ටම ය.
(2) ජීවිතය පවත්වාගෙන යාමට අවශ්‍යවෙතැයි ඇස්තමේන්තු කළ අවම ආදායම් මට්ටම ය.
(3) ඔවුනොවුන්ගේ සංස්කෘතික ප්‍රතිමාන හා සාරධර්මවලට සාපේක්ෂව දිළින්දන් ලෙස ගැනෙන පවුල් ඒකක ප්‍රමාණයයි.
(4) නගරයක් තුළ දිළිඳු ජනතාව සංකේන්ද්‍රණය වී සිටින ප්‍රදේශයන් ය.
(5) ජනගහනයෙන් පහළම ආදායම උපයන 10% හිමිකරගත් සාමාන්‍ය මාසික ආදායම ය.

46. පහත සඳහන් කවරක් මැනීමට ලෝරන්ස් වක්‍රය යොදා ගැනේ ද?

(1) විවිධ රටවල ධනය සහ ආදායම අතර අනුපාතය
(2) විවිධ රටවල පොදු භාණ්ඩ සහ පෞද්ගලික භාණ්ඩ අතර අනුපාතය
(3) විවිධ රටවල ආදායම් සමානතාව සහ ආදායම් අසමානතාව අතර අනුපාතය
(4) කිසියම් රටක ඉහළම ආදායම් ලබන ප්‍රතිශතය සහ පහළම ආදායම ලබන ප්‍රතිශතය අතර අනුපාතය
(5) වැඩකරන වයසේ ජනගහනය සහ වැඩ නොකරන වයසේ ජනගහනය අතර අනුපාතය

කුෂාන් වීරහැන්නැදිගේ

47. කම්කරුවකුගේ ආන්තික ඵලදාව ශුන්‍යය හෝ ශුන්‍යයට ආසන්නව හෝ පවතිනුයේ කවර විරැකියා තත්ත්වයක් යටතේ ද?

(1) සැඟවුණු සේවා වියුක්තිය
(2) අනිච්ඡානුගත සේවා වියුක්තිය
(3) වාරික සේවා වියුක්තිය
(4) ව්‍යුහාත්මක සේවා වියුක්තිය
(5) සාර්ශික සේවා වියුක්තිය

48. ලෝක බැංකුවේ 'ව්‍යාපාර කරගෙන යාමේ පහසුව' පිළිබඳ දර්ශක (Ease of Doing Business Indicators)

(1) සත්කාරක රටවල් වශයෙන් ලබාගත් විදේශ සෘජු ආයෝජන ප්‍රමාණ මත රටවල් පෙළගස්වයි.
(2) ආයෝජන ප්‍රභවස්ථාන රටවල් වශයෙන් තමන් ආයෝජනය කොට ඇති විදේශ සෘජු ආයෝජන මත රටවල් පෙළගස්වයි.
(3) ඒ ඒ රටවල් සතු සාපේක්ෂ වාසි මත කර්මාන්ත පෙළගස්වයි.
(4) බොහෝ රටවල ව්‍යාපාරයක් ආරම්භ කිරීමට සහ පවත්වාගෙන යාමට ඇති පහසුව මිනුම් කරයි.
(5) දිළිඳු රටවල ආයෝජනය කිරීම් අධෛර්යමත් කෙරෙන බැවින් ආර්ථික සංවර්ධනයට බාධකයක් වේ.

කුෂාන් වීරහැන්නැදිගේ

49. 2018 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයේ ආංශික සංයුතිය නිවැරදිව දක්වෙනුයේ කුමන කාණ්ඩය මගින් ද?

| | කෘෂිකර්මය, වනාන්තර සහ ධීවර | කර්මාන්ත | සේවා |
|---|---|---|---|
| (1) | 7.0 | 26.1 | 57.7 |
| (2) | 7.6 | 25.8 | 60.4 |
| (3) | 8.2 | 24.0 | 60.1 |
| (4) | 8.9 | 27.8 | 64.4 |
| (5) | 10.2 | 24.5 | 60.2 |

50. 2018 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ විදේශීය සෘජු ආයෝජන සඳහා ඉතාම ඉහළ දායකත්වය සැපයූ රටවල් හතර වූයේ
(1) චීනය, හොංකොං, ඉන්දියාව සහ මැලේසියාවයි.
(2) චීනය, සිංගප්පූරුව, ජපානය සහ ස්විට්සර්ලන්තයයි.
(3) චීනය, ඉන්දියාව, ජපානය සහ නෝර්වේ ය.
(4) චීනය, කැනඩාව, ඉතාලිය සහ ඇමෙරිකා එක්සත් ජනපදයයි.
(5) චීනය, ඉන්දියාව, මැලේසියාව සහ ජර්මනියයි.

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
# இலங்கைப் பரீட்சைத் திணைக்களம்
# Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021(2022)

ආර්ථික විද්‍යාව I
பொருளியல் I
Economics I

**21 S I**

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
*Two hours*

**43.** වේගවත් ආර්ථික වෘද්ධි අනුපාතික අත්කර ගැනීම සඳහා දායක විය හැක්කේ පහත සඳහන් කවරකට ද?

(1) වඩාත් සීඝ්‍රයෙන් ස්වභාවික සම්පත් පරිභෝජනය කිරීම

(2) ආරක්ෂණවාදී වෙළෙඳ ප්‍රතිපත්ති

(3) පර්යේෂණ හා සංවර්ධනය සඳහා රජයේ අරමුදල් වැඩි කිරීම

(4) පාරිභෝගික සහනාධාර ඉහළ නැංවීම

(5) කුටුම්බ සහ ආයතන මත ඉහළ බදු පැනවීම

**44.** මානව සංවර්ධන දර්ශකය තුළට හසුකොට ගනු ලැබ ඇති ප්‍රධාන සමාජ ආර්ථික පැතිකඩවල් වනුයේ,

(1) දීර්ඝ සහ නිරෝගී ජීවිතයක්, අධ්‍යාපනය සහ යහපත් ජීවන මට්ටමක් ය.

(2) ආයු කාලය, වැඩිහිටි සාක්ෂරතාව සහ ප්‍රති ශීර්ෂ ආදායම ය.

(3) පරිගණක සාක්ෂරතාව, සේවා නියුක්ති අනුපාතිකය සහ දරිද්‍රතා මට්ටම ය.

(4) කැලරි පරිභෝජනය, ආදායම් අසමානතාව සහ මානව සම්පත් සංවර්ධනය ය.

(5) ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව, පරිගණක සාක්ෂරතාව සහ ආහාර සුරක්ෂිතතාව ය.

කුෂාන් වීරහැන්නැදිගේ

**45.** 2010 සහ 2020 යන වර්ෂවල දී කිසියම් රටක ආදායම් ලබන්නන්ගේ ආදායම් පංගු, පංචමක අනුව පහත වගුවෙහි දැක්වේ.

| වර්ෂය | 1වන පංචමකය | 2වන පංචමකය | 3වන පංචමකය | 4වන පංචමකය | 5 වන පංචමකය |
|---|---|---|---|---|---|
| 2010 | 5% | 10% | 15% | 25% | 45% |
| 2020 | 4% | 8% | 12% | 26% | 50% |

මෙම වගුවට අනුව නිගමනය කළ හැක්කේ ගත වූ දස වසර තුළ

(1) රටේ සම්පත් බෙදා වෙන්කිරීමේ දියුණුවක් හටගෙන ඇති බව ය.

(2) ආදායම් බෙදීයාම වඩාත් අසමාන වී ඇති බව ය.

(3) ධනය බෙදීයාම වඩාත් අසමාන වී ඇති බව ය.

(4) අඩු ආදායම් ලබන්නන්ගේ ආර්ථික තත්ත්වය උසස් වී ඇති බව ය.

(5) අඩු ආදායම් ලබන්නන්ගේ ඵලදායිතාව පහළ වැටී ඇති බව ය.

**46.** වදන් සැකසුම් (word processing) ක්ෂේත්‍රය පරිගණක ආධිපත්‍යයට නතුවීමත් සමග පරිගණක නිපුණතාව නොමැති ඇතැම් යතුරුලියන ක්‍රියාකරුවන්ට ඔවුන්ගේ රැකියා අහිමි විය. මෙය පහත සඳහන් කවර විරැකියා තත්ත්වයකට උදාහරණයක් වේ ද? කුෂාන් වීරහැන්නැදිගේ

(1) ඝාර්ෂික සේවා වියුක්තිය

(2) සැඟවුණු සේවා වියුක්තිය

(3) ව්‍යුහමය සේවා වියුක්තිය

(4) වාරික සේවා වියුක්තිය

(5) චක්‍රීය සේවා වියුක්තිය

Activa
Go to S

කුෂාන් වීරහැන්නැදිගේ

**47.** තිරසාර සංවර්ධනය යටතේ ආවරණය කෙරෙන ප්‍රධාන ක්ෂේත්‍ර තුන වනුයේ,

(1) පරිසරය, ආර්ථිකය සහ සමාජයයි.

(2) පරිසරය, ආර්ථිකය සහ සාධාරණත්වයයි.

(3) පරිසරය, කුසගින්න සහ සමාජයයි.

(4) පරිසරය, සාමය සහ දරිද්‍රතාවයයි.

(5) පරිසරය, හවුල්කාරීත්වය සහ සමාජයයි.

**48.** පහත දැක්වෙන වගුවෙහි කල්පිත ආර්ථිකයක ශ්‍රම වෙළෙඳපොළ තත්ත්වය සාරාංශකොට දැක්වේ.

| වර්ෂය | වැඩකරන වයසේ ජනගහනය (මිලියන) | සේවා නියුක්ත ජනගහනය (මිලියන) | සේවා වියුක්ත ජනගහනය (මිලියන) |
|---|---|---|---|
| 2018 | 50 | 24 | 6 |
| 2020 | 60 | 32 | 8 |

මෙම තොරතුරුවලට අනුව පහත සඳහන් කවර ප්‍රකාශයක් නිවැරදි වේ ද?

(1) 2018 සිට 2020 දක්වා සේවා වියුක්ති අනුපාතිකය ඉහළ ගොස් ඇත.

(2) 2018 සිට 2020 දක්වා සේවා වියුක්ති අනුපාතිකය පහළ වැටී ඇත.

(3) 2018 සිට 2020 දක්වා ශ්‍රම හමුදා සහභාගිත්ව අනුපාතිකය 60% සිට 67%ක් දක්වා වැඩි වී තිබේ.

(4) 2018 සිට 2020 දක්වා ශ්‍රම හමුදා සහභාගිත්ව අනුපාතිකය පහළ වැටී ඇත.

(5) 2018 සිට 2020 දක්වා ජනගහනය වර්ධනය වී ඇති නමුදු ශ්‍රම හමුදාව නොවෙනස්ව පැවතී ඇත.

Activ

49. රටවල් පිළිබඳ ආර්ථික වර්ගීකරණයට අනුව, ලෝක බැංකුව විසින් ශ්‍රී ලංකාව ඉහළ මැදි ආදායම් රටක තත්ත්වයට පත් කරනු ලැබුවේ කවර වර්ෂයේ දී ද?

(1) 2016 (2) 2017 (3) 2018 (4) 2019 (5) 2020

50. වර්තමානයේ ශ්‍රී ලංකාවේ අතිශයින් පාඩු ලබන රාජ්‍ය ව්‍යවසායන් තුන වනුයේ,

(1) ලංකා විදුලිබල මණ්ඩලය, ජාතික ලොතරැයි මණ්ඩලය සහ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවයි.
(2) සීමාසහිත ශ්‍රී ලන්කන් ගුවන් සමාගම, ලංකා විදුලිබල මණ්ඩලය සහ ලංකා ඛනිජ තෙල් සංස්ථාවයි.
(3) සීමාසහිත ශ්‍රී ලන්කන් ගුවන් සමාගම, ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ සීමාසහිත ලංකා සතොසයි.
(4) ලංකා විදුලිබල මණ්ඩලය, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සහ රාජ්‍ය ඖෂධ සංස්ථාවයි.
(5) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, ජාතික ඉතිරි කිරීමේ බැංකුව සහ සීමාසහිත ලංකා සීනි සමාගමයි.

AL/2022(2023)/21/S-I

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2022(2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2022(2023)
General Certificate of Education (Adv. Level) Examination, 2022(2023)

**ආර්ථික විද්‍යාව I**
பொருளியல் I
Economics I

**21 S I**

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
*Two hours*

45. පහත සඳහන් කවරක් ආර්ථික වෘද්ධිය අඩුකිරීමට හේතු වේ ද?

(1) ආයෝජනයේ පහළයාමක්

(2) විදේශවල සිට පැමිණෙන ආගමනිකයන් සංඛ්‍යාවේ ඉහළයාමක්

(3) තාක්ෂණික දියුණුවක්

(4) ශ්‍රම සමුදායේ ඉහළ යාමක්

(5) ඉතුරුම් අනුපාතිකයේ ඉහළ යාමක්

කුෂාන් වීරහැන්නැදිගේ

46. සංවර්ධනය යනු

(1) දළ ජාතික ආදායමේ තිරසාර වැඩිවීමකි.

(2) ග්‍රාමීය ජනතාවගේ ආදායම් විෂමතා ඉවත් කරලීම ය.

(3) ආර්ථික ව්‍යුහයේ වෙනස්කම් සමග ආර්ථික වෘද්ධිය හටගැනීම ය.

(4) රටක මූර්ත දළ දේශීය නිෂ්පාදිතය ඉහළ යාම ය.

(5) සාමාන්‍ය පුරවැසියාගේ ජීවිතයේ ගුණාත්මක තත්ත්වය උසස් වීම ය.

47. රටක ආදායම් ව්‍යාප්තිය වඩාත් සාධාරණීය කිරීමෙහි ලා බොහෝ දුරට හැකියාව ඇත්තේ පහත සඳහන් කවර ප්‍රතිපත්තියකට ද?

(1) ආහාර හා රෙදිපිළි මත පොදු අලෙවි බද්දක් ඇති කරලීම

(2) අනුක්‍රම ආදායම් බදු පද්ධතියක් ස්ථාපිත කිරීම කුෂාන් වීරහැන්නැදිගේ

(3) සුඛෝපභෝගී භාණ්ඩ මත පනවනු ලබන දේශීය භාණ්ඩ බදු ඉවත් කරලීම

(4) සියලුම ආදායම් කාණ්ඩ සඳහා බදු අනුපාතික සමානුපාතිකව පහළ දැමීම

(5) අධ්‍යාපනය සහ සෞඛ්‍යය සඳහා ලබාදෙන සහනාධාර අඩු කිරීම

කුෂාන් වීරහැන්නැදිගේ

**48.** ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ දත්තවලට අනුව 2019 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ ජාතික ජනගහන දරිද්‍රතා දර්ශකයත්, වැඩිම ජනගහන දරිද්‍රතා දර්ශකය සහිත දිස්ත්‍රික්කයත් නිවැරදි ව දැක්වෙනුයේ පහත සඳහන් කවර සංයෝජනයකින් ද?

| | ජාතික ජනගහන දරිද්‍රතා දර්ශකය (%) | වැඩිම ජනගහන දරිද්‍රතා දර්ශකය සහිත දිස්ත්‍රික්කය |
|---|---|---|
| (1) | 3.2 | නුවරඑළිය |
| (2) | 4.1 | මුලතිව් |
| (3) | 14.3 | මුලතිව් |
| (4) | 14.3 | කිලිනොච්චිය |
| (5) | 16.0 | බදුල්ල |

**49.** රටක ශ්‍රම හමුදා සහභාගිත්ව අනුපාතිකය ගණනය කිරීම සඳහා පහත සඳහන් කවරක් නිවැරදි වේ ද?

(1) $\frac{\text{සේවා නියුක්ත ජනගහනය} - \text{සේවා වියුක්ත ජනගහනය}}{\text{වැඩ කරන වයසේ ජනගහනය}} \times 100$

(2) $\frac{\text{සේවා නියුක්ත ජනගහනය} + \text{සේවා වියුක්ත ජනගහනය}}{\text{වැඩ කරන වයසේ ජනගහනය}} \times 100$

(3) $\frac{\text{වැඩ කරන වයසේ ජනගහනය} - \text{සේවා නියුක්ත ජනගහනය}}{\text{ආර්ථික වශයෙන් සක්‍රිය ජනගහනය}} \times 100$

(4) $\frac{\text{වැඩ කරන වයසේ ජනගහනය}}{\text{මුළු ජනගහනය}} \times 100$

(5) $\frac{\text{ආර්ථික වශයෙන් සක්‍රිය ජනගහනය}}{\text{මුළු ජනගහනය}} \times 100$

**50.** ශ්‍රී ලංකාව මීට ඉහත ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වැඩසටහන් දහසයකට සම්බන්ධ වී සිටිය ද, එම වැඩසටහන් බොහෝමයක් සාර්ථකව ක්‍රියාවට නැගීමට බලයේ සිටි රජයන් අසමත් වූයේ ප්‍රධාන වශයෙන්

(1) එවැනි වැඩසටහන්වලට අදාළ එකඟ වූ ප්‍රතිසංස්කරණ කොන්දේසි සපුරාලීමේ දී ප්‍රමාණවත් කැපවීමක් නොදැක්වූ බැවිනි.

(2) ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළෙඳපොළවලින් අවශ්‍ය තරම් අරමුදල් සපයාගත හැකි වූ බැවිනි.

(3) විදේශ විනිමය හිඟය යටපත් කරගැනීම සඳහා ව්‍යවහාර මුදල් හුවමාරු ගිවිසුම් මත දැඩි ව රඳා සිටි බැවිනි.

(4) සාජු විදේශ ආයෝජන සුමට ලෙස ගලා ආ බැවින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහාය අවශ්‍ය නො වූ බැවිනි.

(5) නම්‍යශීලී විදේශ විනිමය අනුපාතික ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමේ ප්‍රතිඵල වශයෙන් රටේ විදේශ සංචිත සැලකිය යුතු අන්දමින් ඉහළ ගොස් තිබූ බැවිනි.

**ඉදිරි VIDEO බැලීම සඳහා SUBSCRIBE කරන්න**